**බදුල්ල, හාලි ඇළ සහ ඇල්ල සම්බන්ධ කිරීමේ ජල සම්පාදන ව්‍යාපෘතිය - 2016**

----------------------------------------------------------------------------------------------------

බදුල්ල, හාලි ඇළ සහ ඇල්ල සම්බන්ධ කිරීමේ ජල සම්පාදන ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ එක්සත් ජනපදයේ අපනයන/ ආනයන බැංකුව හා ශ්‍රී ලංකාවේ හැටන් නැෂනල් බැංකුව අතර එළඹි 2013 ජූලි 01 දිනැති අංක ඒ.පී. 086903 එක්ස්.එක්ස් හා 2013 නොවැම්බර් 06 දිනැති අංක 3294 දරන ණය ගිවිසුම් යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

_ ------------------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් වලට අනුව, වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය, එවකට ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ ජල සම්පාදන පහසුකම් පුළුල් කිරීම හා ඉදිකිරීම මගින් සුරක්ෂිත පානීය ජලය සැපයීම හා එමඟින් ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමට හා ප්‍රදේශයේ දුප්පත්කම අඩු කරලීමට දායක වීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය රු.මිලියන 11,809.51 කට සමාන එ.ජ.ඩො. මිලියන 91.37 ක් වූ අතර ඉන් රු. මිලියන 8,356.53 කට සමාන එ.ජ.ඩො.මිලියන 64.89 ක් එක්සත් රාජධානියේ අපනයන/ ආනයන බැංකුව විසින් සැපයීමට එකඟ වී තිබුණි. එයට අමතරව රු. මිලියන 1,213.98 කට සමාන එ.ජ.ඩො.මිලියන 9.26 ක් ශ්‍රී ලංකාවේ හැටන් නැෂනල් බැංකුව විසින් සැපයීමට එකඟ වී තිබුණි. ඉතිරි රු. මිලියන 2,239 කට සමාන එ.ජ.ඩො. මිලියන 17.22 ක් ශ්‍රී ලංකා රජය විසින් සැපයීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2012 දෙසැම්බරයේදී ආරම්භ කර තිබුණු අතර 2017 අගෝස්තු 31 අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

--------------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට

ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර තිබුණේ ද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම් වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගත වන ගැලවීම් වලින් ඇතිවන බලපෑම් හැර මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

ට්‍රාන්ස්ෆෝමරය සැපයීම හා සවි කිරිම සඳහා ලංකා විදුලි බල මණ්ඩලයට සමාලෝචිත වර්ෂය තුල සිදු කළ රු. මිලියන 0.56ක අත්තිකාරම් ව්‍යාපෘතියේ වියදමක් ලෙස සලකා තිබුණි.

#### 2.2.2 නොසැඳුනු ශේෂ

**පහත නිරික්ෂණයන් කරනු ලැබේ.**

(අ) ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති විසින් සිදු කළ කාර්යයන්වල කෙරීගෙන යන වැඩ රු මිලියන 8,410.29ක් විය. කෙසේ වුවද ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව, එය රු මිලියන. 8,312.58ක් ලෙස දක්වා තිබුණි.

(ආ) විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව 2016 දෙසැම්බර් 31 දින දක්වා එකතුව රු මිලියන 2,400.53 ක් උපයෝජනය කර තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව එය රු. මිලියන 3,825.76 ක් ලෙස දක්වා තිබුණි.

3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය
---------------------------------------------------
-

3.1 අරමුදල් උපයෝජනය
------------------------------------------

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ සහ 2016 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම් වල මූල්‍යයනය කිරීම සඳහා එකඟ වූ වටිනාකම | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ ප්‍රතිපාදනය | අරමුදල් උපයෝජනය 2016 වර්ෂය තුළ | | 2016 දෙසැම්බර් 31 දින දක්වා | |
|---|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන |
| එක්සත් ජනපදයේ අපනයන/ආනයන බැංකුව | 64.89 | 8,356.53 | 1,800 | 26.21 | 3,825.77 | 48.65 | 6,800.41 |
| හැටන් නැෂනල් බැංකුව | 9.26 | 1,213.98 | - | - | - | 9.26 | 1,213.98 |
| ශ්‍රී.ලං.ර | 17.22 | 2,239.00 | 210 | 1.97 | 211.06 | 3.64 | 402.54 |
| එකතුව | **91.37** | **11,809.51** | **2,010** | **28.18** | **4,036.83** | **61.55** | **8,416.93** |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ වී වර්ෂ 03 ක් ගත වුවද 2016 දෙසැම්බර් 31 දින වන විටදීත් එ.ජ.ඩො. මිලියන. 91.37 ක් වූ සමස්ත වෙන් කිරීම් වලින් සියයට 67ක් නියෝජනය වන එකතුව එ.ජ.ඩො. මිලියන 61.55 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ආ) වෙන් කරන ලද සම්පත් භාවිතා කොට ව්‍යාපෘතියේ අරමුණු ලගා කර ගැනීම තහවුරු කර ගැනීමට අවශ්‍ය යෝග්‍ය ක්‍රියාකාරී සැලසුමක් ප්‍රමාණවත් පරිදි නොතිබීම නිසා ව්‍යාපෘතියේ මාස 08 ක් වූ ඉතිරි කාල පරිච්ඡේදය තුල ජනතාව වාසය කරන ප්‍රදේශයට අපේක්ෂිත ප්‍රතිලාභ ලැබෙන අයුරින් ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමේ සම්භාවිතාව සැක සහිත බව නිරීක්ෂණය විය.

3.2 <u>භෞතික ප්‍රගතිය</u>.
----------------------------------------

ව්‍යාපෘතිය විසින් සපයන ලද ප්‍රගති වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 85 ක් හා සියයට 69.89ක් විය.

පොම්ප කිරීමේ මධ්‍යස්ථාන, සේවා ජලාශ වේලී (Service Reservoir Dam) සහ ජල මුවතුළු(Intake) ආදියේ ඉදිකිරීම් කටයුතු 2015 දෙසැම්බර් වන විට නිම කිරීමට සැලසුම් කළද සත්‍ය ලෙස නිම කර තිබුණේ 2016 දෙසැම්බර් 31 දිනය. කෙසේ වුවද අදාල වැඩ සම්බන්ධයෙන් යෝග්‍ය සැලසුමක් ප්‍රමාණවත් පරිදි නොතිබීම නිසා විද්‍යුත් යාන්ත්‍රික උපකරණ ස්ථාපනය, සම්ප්‍රේෂණ මාර්ග සැපයීම හා

එළීම, ප්‍රධාන මාර්ග සහ බෙදාහැරීමේ මාර්ග, 2016 දෙසැම්බර් 31 දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි.

**3.3 මතභේදයට තුඩු දෙන කරුණු**

-----------------------------------------------------

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) රු.මිලියන 8,013.21ක් වූ සමස්ත ණය මුදල මුල්‍ය ප්‍රකාශනවල රු.මිලියන 1,201.98ක ණය ලෙසද රු.මිලියන 6,811.23ක් ශ්‍රී ලංකා රජයේ ප්‍රදානයක් ලෙසද වෙන වෙනම දක්වා තිබුණද ණය ගිවිසුම යටතේ වන මූල්‍යමය විධිවිධාන සඳහා ජාතික සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ශ්‍රී ලංකා රජය අතර අතුරු ණය ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ණය ගිවිසුමේ කාණ්ඩ අංක 9.02(J) පරිදි ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ පාරිසරික බලපෑම් වාර්තාවක් පිළියෙල කළ යුතු වුවද ව්‍යාපෘතිය විසින් එය පිළියෙල කර නොතිබුණි.